# ජාතික ළමා ආරක්ෂක අධිකාරිය

# ඇබෑර්තු

ජාතික ළමා ආරක්ෂක අධිකාරියෙහි පහත සඳහන් ඇබෑර්තු සඳහා සුදුසුකම්ලත් ශ්‍රී ලාංකික පුරවැසියන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ. අයදුම්කරුවන් පහත සඳහන් සුදුසුකම් සපුරා තිබිය යුතුය.

## 01. අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් (JM 1-1) තනතුරු - 1 (වසර 01 ක කොන්ත්‍රාත් පදනම)

**සුදුසුකම් :**

**බාහිර අයදුම්කරුවන් : (පහත 1 හෝ 2)**

01. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් උපාධියක් සමග එක් වසරක පශ්චාත් සුදුසුකම් පළපුරුද්ද.
02. තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයක පිළිගත් වෘත්තීය වරලත් ආයතනයක අන්තර් මධ්‍ය විභාගය සමත්වීම සමග එක් වසරක පශ්චාත් වෘත්තීය පළපුරුද්ද.

**අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත 1 හෝ 2 හෝ 3)**

01. ඉහත බාහිර අයදුම්කරුවන් විසින් සපුරාලිය යුතු සුදුසුකම් ලබා තිබීම.
02. තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ 'ආශ්‍රිත නිලධාරී සේවා ගණයේ' (MA 3) තනතුරක අවම වශයෙන් වසර පහක (5) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණකර තිබීම.
03. තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ 'කළමනාකරණ සහකාර' තාක්ෂණික නොවන සේවා ගණයේ (MA 1) II ශ්‍රේණියේ තනතුරක අවම වශයෙන් වසර පහක (5) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**වයස :**

අවුරුදු 22 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්ට මෙම උපරිම වයස් සීමාව බලපානු නොලැබේ.

**වැටුප් පරිමාණය :** JM 1-1-01/2025 : රු. (72,650 - 10 x 1,360 - 18 x 2,040 = 122,970/-)

**බඳවා ගැනීමේ පටිපාටිය :**

පත්වීම් බලධරයා විසින් පත්කරනු ලබන මණ්ඩලයක් මගින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් බඳවා ගැනීම සිදු කෙරේ.

## 02. කළමනාකරණ සහකාර - තාක්ෂණික (MA 2-1) - තනතුරු - 09

**සුදුසුකම් :**

**බාහිර අයදුම්කරුවන් :**

තෘතියක හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණික / වෘත්තීය පුහුණු ආයතනයක් මගින් නිකුත් කරන ලද ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම (NVQ) 5 ට නොඅඩු තොරතුරු තාක්ෂණ / කාර්යාල කළමනාකරණය පිළිබඳ ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන් :**

ඉහත බාහිර අයදුම්කරුවන් විසින් සපුරාලිය යුතු සුදුසුකම් ලබා තිබීම.

**වයස :**

අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි. අභ්‍යන්තර අයදුම්කරුවන්ට මෙම උපරිම වයස් සීමාව බලපානු නොලැබේ.

**වැටුප් පරිමාණය :** MA 2-1 01/2025 : රු. (50,540 - 10 X 540 - 7X630 - 4 X 890 - 20 X 1190 = 87,710/-)

**බඳවා ගැනීමේ පටිපාටිය :**

ලිඛිත තරගකාරී විභාගයක ප්‍රතිඵල සහ / හෝ පත්වීම් බලධරයා විසින් පත් කරනු ලබන මණ්ඩලයක් මගින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් බඳවා ගැනීම් සිදු කෙරේ.

**ලිඛිත තරගකාරී විභාගය :**

විභාගය සඳහා වන විෂයන් පහත දැක්වේ.

- භාෂා ප්‍රවීණතාවය
- යෝග්‍යතා පරීක්ෂණය
- තනතුරට අදාළ විෂය දැනුම

**භාෂා ප්‍රවීණතාවය :**

මෙම ප්‍රශ්න පත්‍රය අපේක්ෂකයින්ගේ ප්‍රකාශන හැකියාව, අවබෝධය, අක්ෂර වින්‍යාසය සහ සරල ව්‍යාකරණ රීති භාවිතයේ දැනුම පරීක්ෂා කෙරෙන ප්‍රශ්න වලින් සමන්විත වේ.

**යෝග්‍යතා පරීක්ෂණය :**

මෙම ප්‍රශ්න පත්‍රය, අපේක්ෂකයින්ට, ඔහුගේ / ඇයගේ නිල රාජකාරී ඉටු කිරීමට ඇති යෝග්‍යතාවය සහ හැකියාව පරීක්ෂා කිරීම සඳහා නිර්මාණය කර ඇත.

**තනතුරට අදාළ විෂය දැනුම :**

මෙම පරීක්ෂණය මගින් අපේක්ෂකයාගේ, තනතුරට අදාළ විෂය දැනුම තක්සේරු කෙරේ.

## 03. කළමනාකරණ සහකාර - තාක්ෂණික නොවන (MA 1-1) තනතුරු 15

**සුදුසුකම් :**

**බාහිර අයදුම්කරුවන්**

අ) අ.පො.ස. (සා/පෙ) විභාගයෙන් එක් වරකදී පහත විෂයන් ඇතුළුව විෂයන් හතරකට (04) සම්මාන සාමාර්ථ සහිතව විෂයන් හයක් (06) සමත්ව තිබීම

i. සිංහල / දෙමළ
ii. ඉංග්‍රීසි භාෂාව
iii. ගණිතය

ආ) අ.පො.ස. (උ/පෙ) විභාගයෙන් විෂයන් තුනක් (03) (පොදු පරීක්ෂණය හැර) සමත්ව තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන් :**

පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති, ප්‍රාථමික සේවා ගණයේ – ශිල්පීය, ප්‍රාථමික සේවා ගණයේ – අර්ධ ශිල්පීය සහ ප්‍රාථමික සේවා ගණයේ – ශිල්පීය නොවන සේවකයින් අයදුම් කිරීම සඳහා සුදුසු වේ.

**අධ්‍යාපනික :**

අ.පො.ස. (සා/පෙ) විභාගයෙන් පහත විෂයන් ඇතුළුව විෂයන් හතරකට (04) සම්මාන සාමාර්ථ සහිතව විෂයන් හයක් (06) සමත්ව තිබීම.

i. සිංහල / දෙමළ
ii. ඉංග්‍රීසි භාෂාව
iii. ගණිතය

**වෙනත් :**

ඉහත සේවා ගණයේ ස්ථිර තනතුරක අවම වශයෙන් වසර පහක (05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**වයස :**

අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි. අභ්‍යන්තර අයදුම්කරුවන්ට මෙම උපරිම වයස් සීමාව බලපානු නොලැබේ.

**බඳවා ගැනීමේ පටිපාටිය :**

ලිඛිත තරගකාරී විභාගයක ප්‍රතිඵල සහ / හෝ පත්වීම් බලධරයා විසින් පත් කරනු ලබන මණ්ඩලයක් මගින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් බඳවා ගැනීම් සිදු කෙරේ.

**ලිඛිත තරගකාරී විභාගය :**

විභාගය සඳහා වන විෂයන් පහත දැක්වේ.

- භාෂා ප්‍රවීණතාවය
- යෝග්‍යතා පරීක්ෂණය / සාමාන්‍ය දැනීම
- පරිගණක පරීක්ෂණය

**භාෂා ප්‍රවීනතාවය :**

මෙම ප්‍රශ්න පත්‍රය අපේක්ෂකයින්ගේ ප්‍රකාශන හැකියාව, අවබෝධය, අක්ෂර වින්‍යාසය සහ සරල ව්‍යාකරන රීති භාවිතයේ දැනුම පරීක්ෂා කෙරෙන ප්‍රශ්න වලින් සමන්විත වේ.

**යෝග්‍යතා පරීක්ෂණය සහ සාමාන්‍ය දැනීම :**

මෙම ප්‍රශ්න පත්‍රය අපේක්ෂකයින්ට, ඔහුගේ / ඇයගේ නිල රාජකාරී ඉටු කිරීමට ඇති යෝග්‍යතාවය සහ හැකියාව සහ කාලීන කටයුතු පිළිබඳ සාමාන්‍ය දැනුම පරීක්ෂා කිරීම සඳහා නිර්මාණය කර ඇත.

**පරිගණක පරීක්ෂණය :**

මෙම පරීක්ෂණය මගින් අපේක්ෂකයාගේ පහත සඳහන් හැකියාවන් පරීක්ෂා කෙරේ.

- තොරතුරු තාක්ෂණයේ මූලික සංකල්ප
- Windows මෙහෙයුම් පද්ධතිය සහ
- ගොනු කළමනාකරණය (File Management)

**වැටුප් පරිමාණය :** MA 1-1 01/2025 : රු. (46,220 - 10 x 540 - 7 x 630 - 4 x 890 - 20 x 1190 = 83,390/-)

**පොදු කොන්දේසි :**

සෑම අයදුම්කරුවෙක්ම ශ්‍රී ලාංකික පුරවැසියකු විය යුතු අතර, විශිෂ්ට චරිතයකින් යුක්ත, තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටුකිරීම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය කායික සහ මානසික යෝග්‍යතාවයකින් හෙබි අයෙකු විය යුතුය.

මෙම තනතුරු සඳහා වූ ආදර්ශ අයදුම්පත ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ නිල වෙබ් අඩවිය වන www.childprotection.gov.lk වෙතින් බාගත කර ගත හැකි අතර, නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2025 ජූනි 02 දින හෝ ඊට පෙර ලැබෙන පරිදි ලියාපදිංචි තැපෑලෙන් පමණක් පහත ලිපිනය වෙත යොමු කළ යුතුය.

සියලුම අයදුම්පත් සමග උප්පැන්න සහතිකයේ, ජාතික හැඳුනුම්පතේ / විදේශ ගමන් බලපත්‍රයේ හා අධ්‍යාපනික, වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද සනාථ කළ හැකි සහතිකපත්වල සහතික කළ පිටපත් සහ ඥාතීන් නොවන නිර්දේශකයින් දෙදෙනෙකුගේ නම්, ලිපින සහ දුරකථන අංකයන් ද එවිය යුතුය.

යම් අයදුම්කරුවකු එක් තනතුරකට වඩා අයදුම්කරන්නේ නම් එම එක් එක් තනතුර සඳහා වෙන් වෙන් වශයෙන් අයදුම්පත් යොමුකළ යුතුය.

අයදුම්පත් බහා එවන කවරයෙහි ඉහළ වම් කෙළවරෙහි අයදුම් කරනු ලබන තනතුර සහ විභාගයට පෙනී සිටීමට කැමති මාධ්‍ය (සිංහල / දෙමළ / ඉංග්‍රීසි) සඳහන් කළ යුතුය.

රාජ්‍ය අංශයේ / සංස්ථා / ව්‍යවස්ථාපිත මණ්ඩල හි දැනට සේවයේ නියුතු අයදුම්කරුවන් සිය අයදුම්පත් ආයතන ප්‍රධානියා මගින් යොමු කළ යුතුය.

ඉහත අවශ්‍යතාවයන්ට අනුකූල නොවන සහ ප්‍රමාදවී ලැබෙන අයදුම්පත් මෙන්ම අසම්පූර්ණ සහ අපැහැදිලි අයදුම්පත්ද කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කෙරේ. මෙම තනතුරු ලබාගැනීම සඳහා කවර ආකාරයකින් හෝ බලපෑම් කිරීම නුසුදුසුකමක් වනු ඇත. කෙටි ලැයිස්තුගත අයදුම්කරුවන් පමණක් ලිඛිත විභාගය සහ / හෝ සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ. මෙම බඳවා ගැනීම් සම්බන්ධයෙන් ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණය අවසාන තීරණය වේ.

**සභාපති,**
**ජාතික ළමා ආරක්ෂක අධිකාරිය,**
**අංක : 330, තලවතුගොඩ පාර, මාදිවෙල, ශ්‍රී ජයවර්ධනපුර.**
**දුරකථන අංක - 0112-778911-14**
**වෙබ් අඩවිය - www.childprotection.gov.lk**